# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,682 - 2010 නොවැම්බර් මස 26 වැනි සිකුරාදා - 2010.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 2104 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2110 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 දෙසැම්බර් මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 නොවැම්බර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


2101 - B 80174— 8,835 (2010/11)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය

### ලේකම් හා ගණකාධිකාරී තනතුර

රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමයේ ලේකම් හා ගණකාධිකාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගෙන් (ස්ත්‍රී/පුරුෂ) අයදුම්පත් කැඳවනු ලැබේ.

i. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ හෝ I පන්තියේ නිලධාරියකු විය යුතුය,

ii. කොළඹට සැතපුම් 30 ක් ඇතුළත ස්ථිරව පදිංචිව සිටිය යුතුය.

iii. 2011.01.01 දිනට වයස අවුරුදු 53ට අඩු විය යුතුය.

iv. රාජ්‍ය සේවයේ අවුරුදු 15 කට නොඅඩු සේවාවක් තිබිය යුතුය.

v. ඉල්ලුම්කරුවන්ට සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් වැඩ කිරීමේ හැකියාව තිබිය යුතුය.

vi. ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳවත්, පරිගණක දැනුම හා පළපුරුද්ද ඇති සංගමයේ සාමාජිකත්වය දරන අය කෙරෙහි හා දෙමළ භාෂාව ගැන දැනුමක් ඇති අය කෙරෙහිත් විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*තනතුරට අදාල වැටුප* : තෝරාගත් අයදුම්කරුට රාජ්‍ය සේවයේදී ලැබූ වැටුප හා දීමනාද ඊට අමතරව ඒකාබද්ධ වැටුපෙන් 50% ක අතිරේක දීමනාවක්ද ගෙවනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු 02 ක (දෙකක) කාලයක් සංගමයේ සේවය සඳහා ද්විතීයනය පදනම මත බඳවාගනු ලැබේ. ඔහු විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඇප ඔප්පුවක් මගින් රු. 10,000 ක රක්ෂණ ඇපයක් තැබිය යුතුය.

සියලු විස්තර සහිත අයදුම්පත් තමන්ගේ අත් අකුරින් සම්පූර්ණ කර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2010.12.24 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඩබ්. එල්. ටී. සුමතිරත්න,
සභාපති,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය.

රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.
2010.11.26

11-679

---

## අධිකරණ අමාත්‍යාංශය

### නීති වාර්තා සිංහලට/දෙමළට පරිවර්තනය කිරීමේ ඒකකයෙහි යතුරු ලේඛක (සිංහල/දෙමළ) තනතුරු සඳහා බඳවා ගැනීම

අධිකරණ අමාත්‍යාංශයේ නීති වාර්තා සිංහලට/දෙමළට පරිවර්තනය කිරීමේ ඒකකය සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *අධ්‍යාපන සුදුසුකම්* :-

i. මාධ්‍ය භාෂාව/සාහිත්‍යය හා ගණිතය ඇතුළු විෂයයන් 04 කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී එක් වාරයකදී අඩු තරමින් විෂයයන් 05 ක් සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.

ii. අ.පො.ස. (උ.පෙළ.) විභාගයේදී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

03. *වෘත්තීය සුදුසුකම්*.—අ.පො.ස. (සා. පෙළ) යතුරු ලියන විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

04. *පළපුරුද්ද* :-
සිංහල/දෙමළ මිනිත්තුවකට වචන 20 ක වේගයෙන් යතුරු ලියනය කිරීමේ හැකියාව

05. *වයස් සීමාව*.—අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

06. වැටුප් පරිමාණය : MN-1-2006 ඒ
මාසිකව රු. 13,120- 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු.22,040

07. බඳවා ගැනීමේ ක්‍රමය.-

i. වෘත්තීය පරීක්ෂණය
සිංහල/දෙමළ යතුරු ලිවීම (අඩුම වේගය විනාඩියට වචන 20 බැගින් විනාඩි 20 ක් තුළ යතුරු ලිවීම).

ii. වෘත්තීය පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් අතරින් කුසලතා ලේඛන අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

*බඳවා ගැනීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

ii. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නා වූ නීතිරීති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය. එමෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා රජය මගින් දැනට නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන නියෝගවලට යටත් විය යුතුය. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති අදාල වේ.

iii. තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි ඉටු කිරීමට යෝග්‍ය වන යහපත් මානසික හා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු අතර, රජයේ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

iv. තනතුරට පත්වී වසර තුනකින් (03) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

v. පත්වීම ලැබූ දින සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

vi. සෑම නිලධාරියෙකුම සේවයට පත් කොට වසර පහක් (05) ඉක්මවීමට පෙර සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය. අදාළ නිලධාරියාගේ පළමු භාෂාව වශයෙන් සලකනු ලබන භාෂාව හැර අදාළ වන පරිදි සිංහල හෝ දෙමළ භාෂාව මේ අනුව දෙවැනි භාෂා මාධ්‍යය ලෙස සැලකේ. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම II ඛණ්ඩය).

අයැදුම්කළ යුතු ආකාරය :

i. මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තෙහි සකස් කරන ලද අයැදුම්පත් 2010.12.10 දින හෝ ඊට පෙර "ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ.

ii. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සිය අයැදුම්පත් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුවේ. අයැදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "නීති වාර්තා සිංහලට/දෙමළට පරිවර්තනය කිරීමේ ඒකකයෙහි යතුරු ලේඛක (සිංහල/දෙමළ) තනතුරු සඳහා අයැදුම්පත්‍රය 2010" යනුවෙන් සඳහන් කළ යුතුය.

iii. *විභාග ගාස්තු.*—විභාග ගාස්තු වශයෙන් රු. 250 ක මුදලක් ලේකම්, අධිකරණ අමාත්‍යාංශය නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අංක 176-1001-7-902-5-180 දරන ගිණුම් අංකයට බැර වන සේ සෑම අපේක්ෂකයකු විසින්ම ගෙවිය යුතුය. මුදල් ගෙවන ලද ලදුපත අයැදුම්පත සමග අමුණා එවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

iv. සෑම අයුරකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති සහ නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයැදුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

v. යම් අයැදුම්කරුවකුගේ අයැදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වේ.

සුහද කේ. ගම්ලත්,
ලේකම්.

අධිකරණ අමාත්‍යාංශය,
කොළඹ 12.

### ආදර්ශ අයැදුම්පත්‍රය

*අධිකරණ අමාත්‍යාංශය*

නීති වාර්තා සිංහලට/දෙමළට පරිවර්තනය කිරීමේ ඒකකයෙහි යතුරු ලේඛක (සිංහල/දෙමළ) තනතුරු සඳහා බඳවා ගැනීමේ අයැදුම්පත්‍රය

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

01. අයැදුම්කරුගේ මුලකුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. අයැදුම්කරුගේ මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. අයැදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

04. අයැදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

05. ස්ථිර ලිපිනය :————.

06. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

07. දුරකථන අංකය : | | | | | | | | | | |

08. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

09. උපන් දිනය: වර්ෂය :———. මාසය :———. දිනය :———.

10. 2010.12.10 දිනට වයස අවු. :———. මාස :———. දින :———.

11. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

12. ජාතිය :————.

13. විවාහක/අවිවාහක බව :————.

14. අයැදුම්කරන්නේ යතුරු ලේඛක (සිංහල/දෙමළ) ද යන වග :

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |

15. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

අ.පො.ස. (උසස් පෙළ) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| | |

16. වෙනත් සුදුසුකම්:—————.

17. විභාග ගාස්තු ගෙවන ලද දිනය :—————.

ලදුපත අමුනන්න

18. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කරන තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තු ගෙවන ලද ලදුපත අමුණා ඇති බවත් මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත්වන බවත්, තෝරා පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් දැන සිටිමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :—————.

*ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත අයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය*

"ආ" කොටස

(ආයතන ප්‍රධානියාගේ නිර්දේශය)

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන ...................... මයා./ මිය./ මෙනවිය ...................... දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ/ පළාත් සභාවේ ................. වශයෙන් සේවය කරන බවත්, විභාග ගාස්තු වශයෙන් රු. 250 ක මුදලක් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අයැදුම්පතෙහි සඳහන් ගිණුම් අංකයට බැර වන සේ ගෙවා ඇති බවත්, ඉහත දක්වා ඇති විස්තර නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක බවත්, මම සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
බලයලත් නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
දිනය :—————.

11-752

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය/ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවන් හි ඉදුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීමට පිරිමි/කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

(අ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව
(ආ) උපකරණ ශාඛාව
(ඇ) ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

(අ) **විද්‍යුත් ඉංජිනේරු ශාඛාව :**

***විද්‍යුත් ඉංජිනේරු නිලධාරීන් (පිරිමි/නිත්‍ය)***

* විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු පාඨමාලාව සඳහා උපාධිය සම්පූර්ණ කර තිබීම හෝ විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු ධාරාවෙන් ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (එන්ඩීටී) සම්පූර්ණ කර තිබීම හෝ විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු ධාරාවෙන් උසස් ජාතික ඩිප්ලෝමාව (එච්එන්ඩී) සම්පූර්ණ කර තිබීම හෝ විවෘත විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු ධාරාවෙන් තාක්‍ෂණ ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබීම හෝ විද්‍යුත් හා විදුලි සංදේශ ධාරාවෙන් ඉංජිනේරු තාක්‍ෂණ ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබීම හෝ වෙනත් සමාන සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම.

ජාල කළමණාකාර නිලධාරීන්/මෘදුකාංග ක්‍රම ලේඛක නිලධාරීන් - පිරිමි (නිත්‍ය)

* සිව් අවුරුදු (04) තොරතුරු තාක්‍ෂණ විද්‍යාවේදී උපාධියක්/පරිගණක විද්‍යාවේදී උපාධියක්/පරිගණක ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් සම්පූර්ණ කර අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්ද තිබීම හෝ පරිගණක විද්‍යාව විෂයක් ලෙස ඇතුලත් වූ තුන් අවුරුදු (03) පරිගණක විද්‍යාවේදී උපාධියක් සම්පූර්ණ කර තිබීම/අවම වශයෙන් අවුරුදු දෙකක පළපුරුද්ද තිබීම හෝ තොරතුරු තාක්‍ෂණය පිළිබඳ තුන් අවුරුදු (03) විද්‍යාවේදී උපාධියක්/පරිගණක විද්‍යාව විෂයයක් ලෙස ඇතුලත් වූ තුන් අවුරුදු (03) විද්‍යාවේදී උපාධියක් හෝ උසස් ජාතික ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන රජය විසින් පිළිගනු ලැබූ ආයතනයක පාඨමාලාවක් හදාරා තිබීම සහ අවම වශයෙන් එක් අවුරුද්දක (01) පළපුරුද්දක් තිබීම හෝ ජාතික කළමණාකරණ (NIBM ) ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණකර අවම වශයෙන් පරිගණක ජාලා කළමනාකරුවකු ලෙස අවුරුදු දෙකක (02) පළපුරුද්දක් ජාල කළමණාකාර නිලධාරීන් සඳහා තිබිය යුතු අතර/අවම වශයෙන් අවුරුදු දෙකක (02) මෘදුකාංග නිර්මාණය පිළිබඳව පළපුරුද්දක් මෘදුකාංග ක්‍රම ලේඛක නිලධාරීන් සඳහා තිබිය යුතුය.

* සෑම විද්‍යාවේදී උපාධියක්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් විය යුතුය.

* ජාල කළමනාකාර නිළධාරීන් සඳහා ජාල කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අනිවාර්ය වන අතර මෘදුකාංග ක්‍රම ලේඛක නිලධාරීන් සඳහා අවම අවශයෙන් ASP.NET සහ (#. NET) භාවිතයෙන් මෘදුකාංග නිර්මාණය පිළිබඳව පළපුරුද්ද අනිවාර්ය වේ.

* ජාල කළමනාකාර නිළධාරීන් සඳහා CCNA/MCSE සුදුසුකම් තිබීම, Microsoft/Linux Server පිළිබඳ හසල දැනුමක් තිබීම, MS Exchange Server පිළිබඳව මනා දැනුමක් තිබීම ආදිය විශේෂ සුදුසුකම් සේ සලකනු ලබන අතර මෘදුකාංග ක්‍රම ලේඛක නිලධාරීන් සඳහා MCAD වැනි වෘත්තිය සුදුසුකම් ලබා තිබීම, සහ NET Frame work, ASP.NET/# Visual studio සහ MSSQL Server සහ 2005 සහ 2008 ආදිය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

* සෑම අයදුම්කරුවෙකුම ලිඛිත සහ ප්‍රායෝගික පරීක්‍ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය.

(ආ) *උපකරණ ශාඛාව :*

භෝජනාගාර කළමණාකරු - පිරිමි (නිත්‍ය)

හෝටල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් හා දේශීය/විදේශීය ආයතනයක හදාරන ලද කාණ්ඩ 04කින් සමන්විත පූර්ණකාලීන ආගන්තුක සත්කාර පිළිබඳ මූලික පාඨමාලාවක් හදාරා තිබීම හා තරු පංති හෝටලයක ආහාරපාන අංශයේ භෝජනාගාර හා ආහාර කළමණාකරණය පිළිබඳ වසර දෙකක පළපුරුද්දක් තිබිය යුතුය.

(ඇ) *ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව :*

*සිවිල් ඉංජිනේරු නිලධාරි - පිරිමි (නිත්‍ය)*

* සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව සම්බන්ධව ඒ හා සමාන සුදුසුකම් තිබීම.

* සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (එන්ඩීටී)/එන්ඩීඊඑස්/එච්එන්ඩීඊ හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම.

*කාර්මික ඉංජිනේරු නිලධාරි - පිරිමි (නිත්‍ය)*

* කාර්මික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ කාර්මික ඉංජිනේරු විද්‍යාව සම්බන්ධව ඒ හා සමාන සුදුසුකම් තිබීම.

* කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (එන්ඩීටී)/එන්ඩීඊඑස්/එච්එන්ඩීඊ හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම.

*විදුලි ඉංජිනේරු නිලධාරි - පිරිමි (නිත්‍ය)*

* විදුලි ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ විදුලි ඉංජිනේරු විද්‍යාව සම්බන්ධව ඒ හා සමාන සුදුසුකම් තිබීම.

* විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (එන්ඩීටී/එන්ඩීඊඑස්, එච්එන්ඩීඊ) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම.

* *වාස්තු විද්‍යාඥ - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වෙච්ඡා) වරලත් වාස්තු විද්‍යාඥ*

* Bsc (BE) උපාධිය සමග Mscin Architecture උපාධිය හෝ මොරටුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද B/Arch උපාධිය

*(ප්‍රමාණ සමීක්‍ෂක නිලධාරි - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වෙච්ඡා)*

මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද Bsc in (QS) උපාධිය හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්‍ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Graduate Member) හෝ (Technical Member) ලබා තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසරක පළපුරුද්දක් ලබා තිබීම.

3. *අනෙකුත් සුදුසුකම් :*

(අ) පුරවැසි භාවය : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ආ) සිවිල් තත්වය : විවාහක/අවිවාහක.
(ඇ) ස්ත්‍රී පුරුෂ භාවය : පිරිමි/කාන්තා (අදාළ පරිදි)
(ඈ) වයස : 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
(ඉ) උස : පිරිමි අඩි 5 අඟල් 5 ක් හෝ ඊට වැඩි විය යුතුය. කාන්තා අඩි 5 අඟල් 4 ක් හෝ ඊට වැඩි විය යුතුය.
(ඊ) පපුව : අඟල් 32 ට නොඅඩු විය යුතුයි. (පිරිමි)
(උ) දෘෂ්ඨී තීක්ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහිතව හෝ රහිතව).

4. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුව ද, හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සළකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ට දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැළකිල්ලක් දක්වනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා අවශ්‍යතා.*—තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

8. තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ෆ්ලයින් ඔෆිසර්/)ෆ්ලයිට් ලෙප්ටිනන්ට් ස්කොඩ්‍රන් ලීඩර් යන නිලයන් හි නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියට පත්කරනු ලැබේ.

9. තෝරා ගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේ ය.

10. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරින් පාලනය කරනු ලැබේ.

11. 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව, "සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක" කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ II වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේ නම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ II වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

12. ගුවන් හමුදා නිලධාරින් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුවද යවනු ලැබීමට යටත් වේ.

13. අවිවාහක නිලධාරින්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහ භාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරින්ගේ

ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

14. විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15 (ආ) (16) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

15. *(අ)* ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරීලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ. :

පයිලට් ඔෆිසර් - රු. 211,800 වසරකට
ෆ්ලයින් ඔෆිසර් - රු. 275,220 - 34 x 7,740 = රු. 538,380 වසරකට
ෆ්ලයිට් ලෙප්ටිනන්ට් - රු. 321,660 - 28 x 7,740 = රු. 538,380 වසරකට
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 352,620 - 24 x 7,740 = රු. 538,380 වසරකට
විංග් කමාන්ඩර් - රු. 362,100 - 20 x 9,480 = රු. 551,700 වසරකට
ගෲප් කැප්ටන් - රු. 441,060 - 18 x 12,600 = රු. 667,860 වසරකට

*(ආ)* *අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 5,250 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250 ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට රු. 5,000 ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,000 ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 100.00 බැගින් ගෙවනු ලැබේ.)
(6) අතිරේක දීමනාව මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.
(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255 ක් ගෙවනු ලැබේ.
(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(9) ආහාර දීමනාව මසකට රු. 10,609.75 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50ක්) ගෙවනු ලැබේ.
(11) නොමිලේ ගමන් කළහැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/බිරිඳට/සහ දරුවන්ට) දෙනු ලැබේ.
(12) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(13) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(14) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයින්ට අදාළ පරිදි).
(15) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30 ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
(16) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ගෲප් කැප්ටන් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට රු. 1,850 සිට රු. 4,250 දක්වා.

16. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.*—විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. *ඉල්ලුම්කරුවන්ට උපදෙස් :*

*(අ)* පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2010 දෙසැම්බර් මස 03 වැනි දින මධ්‍යහ්න 12.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ, "ප්‍රධාන ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ "......... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සළකා බලනු නොලැබේ.

*(ආ)* රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන් හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු /සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දියයුතුය.

*(ඇ)* ඉල්ලුම්පත් සමග අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතික පත්වල පිටපත් ඉදිරිපත් කළ යුතුය :-

(1) උප්පැන්න සහතිකය,
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික,
(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයින් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික,
(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදී සනාථ කරන සහතික,
(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

* *සැලකිය යුතුයි :-* මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේ දී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමටද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

19. *තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :*

*(අ)* ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

*(ආ)* සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයින් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(ඉ) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

__________,
ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් චීෆ් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ......... ශාඛාවේ**

**අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :_________.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)
2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :_________.
3. ජාතික හැඳුනුම්පත් අංකය :_________.
4. ඉල්ලුම්කරන ශාඛාව :_________.
5. ඉල්ලුම්කරන තනතුර :_________.
6. ස්ථිර ලිපිනය :_________.
7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :_________.
8. තැපැල් ලිපිනය :_________.
9. උපන් දිනය :
අවුරුද්ද :_________. මාසය :_________. දිනය :_________.
10. උස :
අඩි :_________. අඟල් :_________.
11. දිස්ත්‍රික්කය :_________.
12. ඡන්ද කොට්ඨාසය :_________.
13. ග්‍රාම සේවක කොට්ඨාසය :_________.
14. දුරකථන අංකය :_________.
15. විවාහක හෝ අවිවාහක බව :_________.
16. පාසල් සහ/හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ/ විශ්ව විද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ):<br>අ.පො.ස. (උ.පෙළ) :<br>වෘත්තීය සුදුසුකම් :<br>වෙනත් : | | |

17. පාසලෙන්/විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :

| සේවායෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැන් ලිපිනය |
|---|---|---|---|
| පියා : | | | |
| මව : | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :_________.
20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න) :_________.
21. පාසලේ දී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :_________.
22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :_________.
23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :_________.
24. සිවිල් හෝ යුද්ධ උසාවියක දී, වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න :_________.
25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාලය, රජය විසින්

පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

26. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

27. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11-757

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය — 2010

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ "ලේකම්" යන පදයෙන් අදහස් කෙරෙන්නේ "රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්" ය. "සේවය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ "ශ්‍රී ලංකා පරිපාලන සේවය" ය.

2. ලිඛිත විභාගය :—මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ. :-

(i) සාමාන්‍ය බුද්ධිය
(ii) රචනය හා සාරාංශය
(iii) සාමාන්‍ය දැනුම
(iv) කළමනාකරණ අභියෝග්‍යතාව

*විභාග දිනය.*—මෙම විභාගය 2011 මාර්තු මස කොළඹ නගරයේදී (නගර අංක 01) හා යාපනය නගරයේදී (නගර අංක 02) පැවැත්වෙනවා ඇත. විභාගයට ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/අමාත්‍ය මණ්ඩලයේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

*වාචික පරීක්ෂණය.*—ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයැදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තාවූද අපේක්ෂකයින් සම්බන්ධයෙන් ව්‍යුහගත වාචික පරීක්ෂණය පැවැත්වෙන දිනය ලේකම් විසින් තීරණය කරනු ඇත.

3. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/අමාත්‍ය මණ්ඩලයේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

4. *සේවා කොන්දේසි.*—රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1419/3 සහ 2005 නොවැම්බර් මස 14 වැනි දින දරන අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද) 2005 ඔක්තෝබර් මස 28 වැනි දින දරන සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු සේවයේ III වැනි පන්තියට පත්කරනු ලැබේ.

4.1 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයැදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

5. ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :-

විශේෂ ශ්‍රේණිය - රු. 42,390 - 12 x 1,310 - රු 58,110.
I වැනි පංතිය - රු. 36,755 - 17 x 1,050 - රු. 53,555.
II වැනි පංතිය - රු. 30,175 - 8 x 790 - රු. 35,705.
III වැනි පංතිය - රු. 22,935 - 10 x 645 - රු. 29,385.

(පත්වීමේ දින සිට වසර 03 ක් ඇතුළත I වැනි කාර්යක්ෂමතා කඩඉම සහ පත්වීමේ දින සිට වසර 06 ක් ඇතුළත II වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු අතර, පත්වීම ලැබ වසර 05 ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය)

මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තිය සඳහා වේ.

6. *සෞඛ්‍ය හා චරිතය.*—අපේක්ෂකයා සෞඛ්‍ය අතින් නිසි පරිදි සුදුසුකම් ලබා ඇති බවට ද විශිෂ්ට චරිතයකින් යුක්ත බවට ද, ලේකම් සෑහීමකට පත්විය යුතුය. ඔහු හොඳ ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කෙරෙනු ඇත.

7. සුදුසුකම්.- මේ සඳහා පෙනී සිටින අපේක්ෂකයෙකු,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතුය.
   (අ) උපාධිය බලපවත්නා දිනය 2010.12.27 දින හෝ එදිනට පෙර දිනයක් විය යුතුය.
iii. 2010.12.27 දිනට වයස අවුරුදු 28 එළඹ නොසිටිය යුතුය.
iv. විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් ද යුක්ත විය යුතුය.
v. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

*සටහන.-*

i. ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට, දෙවරකට වඩා පෙනී සිටීමට කිසිවකුට අවසර නොමැත.

ii. මෙම විභාගය සඳහා අයැදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2010.12.27 දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. *විභාග ගාස්තු.*—විභාගය සඳහා වූ ගාස්තුව රු. 1000 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ආදායම් ශීර්ෂ 2003.02.13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

9. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :-

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා ම පිරවිය යුතුය. 1.0 සිට 3.11 තෙක් වන ශීර්ෂ ඉල්ලුම්පත් කඩදාසියේ පළමු වැනි පිටුවේද, 4.0 සිට 8.0 තෙක් එහි දෙවන පිටුවේ ද වන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක) සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ආ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතු ය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කර ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2010.12.27 වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුව (සංවිධාන හා විදේශ විභාග ශාඛාව), විභාග කොමසාරිස් ජනරාල් වෙතට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිළිව "ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම පිණිස වන විවෘත තරග විභාගය - 2010" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ඈ) අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් එලදායී වනු ඇත.

10. *විභාගයට ඇතුළුවීම.*—

(අ) ඉල්ලුම්පත් ලැබී ඇති සියලුම පුද්ගලයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. සෑම අපේක්ෂකයකු ම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රය ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන.-* අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

11. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත. :-

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

12. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.*—අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/අමාත්‍ය මණ්ඩලයේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :-

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. විභාගයට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය.

(ඇ) අපේක්ෂකයකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

(ඈ) ප්‍රධාන විෂයය එක භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන* :-

(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති සුදුසුකම් ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 7(ii) ඡේදයේ ඇති උපාධි සුදුසුකම් වේ.

(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

15. *තෝරා ගැනීමේ ක්‍රමය.*- පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයක් :

(i) සාමාන්‍ය බුද්ධිය - කාලය පැය 01 යි - ලකුණු 100 යි,
(ii) රචනය හා සාරාංශ ලිවීම - කාලය පැය 02 යි - ලකුණු 100 යි,
(iii) සාමාන්‍ය දැනුම - කාලය පැය 02 යි - ලකුණු 100 යි,
(iv) කළමනාකරණ අභියෝග්‍යතාවය - කාලය පැය 02 යි - ලකුණු 100 යි.

අපේක්ෂකයින් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

*වාචික පරීක්ෂණය* : (ලකුණු 25 යි)

ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයැදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබුවන් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත්තා වූ ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය විසින් පුරප්පාඩු සංඛ්‍යාවට අනුකූලව ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ලකුණු සීමාවකට ඉහළින් මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ ද අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහත සුදුසුකම් ලබන අයැදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටී නම් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන අපේක්ෂකයින් සංඛ්‍යාවක් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලකුණු ලබා දීමේ ක්‍රමය පත්වීම් බලධාරියා/රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ මුල් අවස්ථාවේ දී අනුමත කරනු ලැබේ.)

16. ලිඛිත විභාගයට පෙනී සිටියා වූ ද, සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ ද, අයදුම්කරුවන් අතුරින් ඉහළම මුළු ලකුණු ලැබූ අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙලට පත්වීම් සඳහා තෝරාගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.)

17. *විෂය නිර්දේශය* :-

(i) *සාමාන්‍ය බුද්ධිය* (කාලය පැය 1 යි - ලකුණු 100 යි)

පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. (බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.)

(ii) *රචනය සහ සාරාංශය ලිවීම* (කාලය පැය 2 යි ලකුණු 100 යි)

දෙන ලද මාතෘකාවන්/තේමාවන් සමූහයක් අතුරෙන් අපේක්ෂකයා විසින් ම තෝරා ගන්නා ලද මාතෘකාවන්/තේමාවන් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය හා පරිකල්පන ශක්තිය මැන බැලීමට සහ තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලි ව සහ නිවැරදි ව ප්‍රකාශ කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(iii) *සාමාන්‍ය දැනුම* (කාලය පැය 2 යි - ලකුණු 100 යි)

ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.)

(iv) *කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව* (කාලය පැය 2 යි - ලකුණු 100 යි)

ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම යනාදී වශයෙන් අපේක්ෂකයෙකු සතු විශිෂ්ට කළමනාකරණ කුසලතාවන් ඔහුට

යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්ථාවයන් අනුසාරයෙන් තීර්ණය කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. (බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.)

අමාත්‍ය මණ්ඩලයේ නියෝග පරිදි,

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යංශය.

2010 නොවැම්බර් මස 12 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2010**

Open Competitive Examination for Recruitment to Class III of the Sri Lanka Administrative Service - 2010

ඉල්ලුම්පත්‍රය

| 1.0 මාධ්‍යය— | 2.0 නගරය |
| --- | --- |
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය<br>සිංහල - 2<br>දෙමළ - 3<br>ඉංග්‍රීසි - 4<br><br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) | විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය<br><br>එම නගර අංකය<br><br>(ගැසට් නිවේදනයේ 2 වැනි ඡේදයට අනුව) (නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.) |

3.0 *පෞද්ගලික තොරතුරු :*

3.1 මුල’කුරු අගට යොදා මුල’කුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ (SILVA, A. B.)

3.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.

3.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :———.

3.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———.

3.6 ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ -0, ස්ත්‍රී - 1) :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.7 විවාහක/අවිවාහක බව :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
(අවිවාහක -1, විවාහක -2)

3.8 ජන වර්ගය :
(සිංහල - 1, දෙමළ - 2 ඉන්දියානු දෙමළ - 3 මුස්ලිම් - 4, වෙනත් - 5).
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

3.9 ජාතික හැඳුනුම්පත් අංකය :

3.10 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.11 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු මාස දින

4.0 ශ්‍රී ලංකා පරිපාලන සේවයට පත්කිරීම සඳහා වූ මීට පෙර පැවැත්වූ විභාගයට පෙනී සිටි වර්ෂ සඳහන් කරන්න :
(අ) ———
(ආ) ———
(ඇ) ———

5.0 (i) උපාධිය ලද දිනය (මෙම සුදුසුකම් ඇත්දැයි බැලීමට නිවේදනයේ 7 (ii) කරුණාකර හොඳින් කියවා බලන්න) :———.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :———.
(iii) ලියාපදිංචි වූ අංකය :———.
(iv) බාහිර/අභ්‍යන්තර :———.
(v) උපාධිය :———.
(vi) විෂයයන් :———.
(vii) පන්තිය :———.
(viii) ඉහළ/පහළ :———.
(ix) විභාග අංකය :———.
(x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :———.

6.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න :-

(ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න)
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

7.0 *අයදුම්කරුගේ සහතිකය :*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක...............හා ............ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

8.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* (*ගැසට් නිවේදනයේ* 9 (*ඈ*) *පරිදි විය යුතුය*) :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන.................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ............ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

———,
(අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන)

දිනය :———.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි).

11-775

---

**පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීම - 2010**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :

2010 දෙසැම්බර් මාසයේදී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් විසින් මහනුවරදී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද, මෙහි පහත සඳහන් කොන්දේසිවලටද, යටත්ව පර්යේෂණ සහකාර සේවයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(ii) විවෘත බඳවා ගැනීම් යටතේ පත්කරනු ලබන නිලධාරීන් වසර 3ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්‍ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණයෙන් සමත්ව තිබීමද අවශ්‍ය වේ.

(iii) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතුය.

(iv) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලටද, ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :

MN 3 - 2006A - පර්යේෂණ සහකාර සේවයේ II "ආ" ශ්‍රේණියේ රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු.27,885
(රා. පරි. ච. ලේ. 07/2008 අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 15,005 - 4 x 180 - 6 x 240 - රු.17165 වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමි වේ.

II 'ආ' ශ්‍රේණියේ නිලධාරීන් තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :

(i) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපායි.
(ii) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(iii) මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

06. *අධ්‍යාපන සුදුසුකම්* :

ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලයක් විසින් නිකුත් කරන ලද ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

*සහ*

රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් 3කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවරක සමත් වීම.

*සහ*

භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම;

*හෝ*

ඒ හා සමාන විභාගයකින් සමත් වීම.

*සටහන.*—ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ඩිප්ලෝමාවක් ලබාගත් අය එම විශ්වවිද්‍යාලයේ එම ඩිප්ලෝමාවට අදාල පදනම් පාඨමාලාව සමත් වී ඇත්නම් අ. පො. ස. (සා. පෙළ) සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ හැක.

07. *බඳවා ගැනීමේ ක්‍රමය.*—මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පොදු තරග විභාගයට පෙනී සිටිය යුතුය.

(i) පොදු තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

08. *විභාගය* :

(i) මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.
(iii) ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(iv) විභාග ගාස්තුව රු. 300කි.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කරගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.
(v) *විභාග විෂයයන්* : විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.:-
1. බුද්ධි පරීක්ෂණය,
2. තාක්ෂණික ප්‍රශ්න පත්‍රය.

(vi) *විෂය නිර්දේශය* :

(අ) *බුද්ධි පරීක්ෂණය* : කාලය පැය 1යි. මුළු ලකුණු 100 යි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්වය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ආ) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය* : කාලය පැය 1යි. මුළු ලකුණු 100 යි.

පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි:-

(i) රසායනාගාර උපකරණ හඳුනාගැනීම හා නඩත්තුව;

(ii) රෝග විනිශ්චය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම:
ව්‍යාධි වේද
පරපෝෂිත වේද
ක්ෂුද්‍ර ජීව වේද
මස්තු වේද
පෝෂණ ;

(iii) තත්ත්ව පාලනය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම :-
භෞතික පරීක්ෂණ
රසායනික පරීක්ෂණ
සංවේදතා පරීක්ෂණ

(iv) රසායනාගාර පවිත්‍රතාව, විෂබීජහරණය ;

(v) සාම්පල් ලබාගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය ;

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :-

(i) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් ඉල්ලුම්පත්‍රය 2010 නොවැම්බර් 30 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ" පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන*.—රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(i) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුණහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුයඃ-

(*අ*) අපේක්ෂකයන්ගේ සම්පූර්ණ නම :————.

(*ආ*) ලිපිනය :————.

(*ඇ*) ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :————.

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. :-

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීමේ සහතික,
(iii) සත්ව පාලන ඩිප්ලෝමා සහතිකය.

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය* .-විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය.

(iii) වලංගු විදේශ ගමන් බලපත්‍රය. (විභාග දිනට අවුරුදු 3කට කලින් නිකුත් කරන ලද).

*සාවද්‍ය තොරතුරු සැපයීම* .- මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේ ය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේ ය.

මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (ii "අ") ඡේදයේ ආරම්භයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මගින් බඳවා ගත යුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

ආචාර්ය ඒ. ඩී. එන්. චන්ද්‍රසිරි,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ. ආ.)

2010 ඔක්තෝබර් මස 25 වැනි දින,
පේරාදෙණිය,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දී ය.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ "ආ" ශ්‍රේණියේ පර්යේෂණ සහකාර නිලධාරි තනතුර සඳහා අයදුම්පත

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |
|---|---|

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. (*උදා* : SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. ලිපිනය :

2.1 පෞද්ගලික :————.

2.2 රාජකාරි ලිපිනය :————.

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :————.

03. ස්ත්‍රී පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ සළකුණු කරන්න.)

3.1

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

3.2 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

3.4 විවාහක අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ සළකුණු කරන්න.)

| | |
|---|---|
| විවාහක | |
| අවිවාහක | |

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. මාසය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.3 (අ) සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් ආයතනය :————.

4.4 සත්ව පාලන ඩිප්ලෝමාව ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්):-

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.

මුදල් ඇණවුම් අංකය :————.

*සම්පූර්ණ විභාග ගාස්තුව රු. 300 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට. ගෙවන කාර්යාලය : පේරාදෙණිය.*
*කුවිතාන්සිය මෙහි අලවන්න.*

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර

අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම දෙපාර්තමේන්තුවේ …………… ලෙස සේවය කරන ……………… මයා./මිය./මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා,
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.

11-633

---

**යෞවන කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - නාරාහේන්පිට**

| *අංක* | *පූර්ණ කාලීන පාඨමාලා* | *NVQ මට්ටම* | *පාඨමාලා කාලය මාස* | *වැඩහල් පුහුණුව මාස* | *සුදුසුකම්* | *ගාස්තු රු. ශත* |
|---|---|---|---|---|---|---|
| 1 | Offset Lithographic Machine Operator | II | 6 | 6 | B | 5,000.00 |
| 2 | Computer Application Assistant (Disabled) | III | 6 | 6 | - | Free |
| 3 | මෝටර් රථ කාර්මික ශිල්පී | IV | 18 | 12 | A | 10,000.00 |
| 4 | විදුලි ශිල්පී | IV | 12 | 12 | A | 4,000.00 |
| 5 | මෝටර් රථ වායුසමීකරණ ශිල්පී | IV | 6 | 6 | B | 4,000.00 |
| 6 | කොණ්ඩා සැකසුම් ශිල්පී | IV | 4 | 6 | B | 40,000.00 |
| 7 | රූපලාවන්‍ය ශිල්පී | IV | 4 | 6 | B | 30,000.00 |
| 8 | Baker | IV | 4 | 6 | B | 25,000.00 |
| 9 | රූපලාවන්‍ය හා කොණ්ඩා සැකසුම් ශිල්පී (ශ්‍රවණාබාධිත) | IV | 6 | 6 | - | Free |
| 10 | Computer Graphic Designer (Disabled) | IV | 6 | 6 | - | Free |
| 11 | Computer Hardware Technician & CISCO IT Essentials (A+) | IV | 6 | 6 | D | 12,000.00 |
| 12 | Computer Graphic Designer | IV | 4 | 6 | H | 12,000.00 |
| 13 | Cook | IV | 4 | 6 | B | 25,000.00 |
| 14 | National Diploma in Information & Communication Technology | V | 12 | 6 | F | 25,000.00 |
| 15 | Diploma in Drafting Technology | - | 12 | 12 | C | 15,000.00 |
| 16 | Quantity Surveying (English Medium) | - | 12 | 12 | K | 50,000.00 |
| 17 | Diploma in Industrial Management | - | 6 | - | E | 20,000.00 |
| 18 | Diploma in Secretarial Practice | - | 12 | 6 | D | 10,000.00 |
| 19 | Adobe Certified Professional | - | 6 | 6 | G | 30,000.00 |
| 20 | Microsoft Certifications | - | 6 | 6 | G | 30,000.00 |
| 21 | CISCO Computer Networking | - | 6 | - | D | 40,000.00 |
| 22 | Diploma in Culinary Art | - | 8 | 6 | B | 40,000.00 |

## PART TIME COURSES

| *අංක* | *අර්ධ කාලීන පාඨමාලා* | *NVQ මට්ටම* | *කාලය (Hrs.)* | *සුදුසුකම්* | *ගාස්තු රු. ශත* |
|---|---|---|---|---|---|
| 1 | Computer Graphic Designer | IV | 392 | J | 17,000.00 |
| 2 | Auto Mobile Technician (Engine/ Petrol/Diesel) | None | 160 | I | 8,000.00 |
| 3 | Baker | None | 100 | B | 25,000.00 |
| 4 | Auto Mobile Air Condition Technician | None | 100 | B | 7,000.00 |
| 5 | Diploma in Culinary Art | None | 200 | F | 40,000.00 |
| 6 | International Computer Driving License (ICDL) | None | 150 | D | 10,000.00 |
| 7 | Microsoft Certification | None | 100 | G | 30,000.00 |
| 8 | CISCO Computer Networking | None | 300 | G | 40,000.00 |
| 9 | Adobe Certified Professional | None | 12 months | G/J | 30,000.00 |
| 10 | Java Programming (SCJP) | None | 150 | H | 20,000.00 |
| 11 | Web Designing and Development | None | 150 | B | 10,000.00 |
| 12 | MS-Office | None | 100 | B | 8,000.00 |
| 12 | CISCO - IT Essentials (A+) Hardware | None | 150 | D | 12,000.00 |

*සුදුසුකම්* :-

A- අ. පො. ස. (සා. පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයයන් 06 කින් සමත් වීම.
B- අ. පො. ස. (සා. පෙළ) දක්වා හදාරා තිබීම.
C- අ. පො. ස. (උ. පෙළ) විෂයයන් 03 කින් සමත්වීම.
D- අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විද්‍යාව, ගණිතය ඇතුළුව විෂයන් 06 කින් සමත්වීම.
E- පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාව හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු අය හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික/වැඩ මූලික සහායක/වැඩ අධීක්ෂක රැකියාවක අවුරුදු 02 ක පළපුරුද්දක් තිබීම.
F- ජාතික තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලව හදාරා තිබීම හෝ රජය පිළිගත් පූර්ණ කාලීන හය මාසික පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.
G- අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව සම්මාන සහිතව සමත්වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
H- අ. පො. ස. (සා. පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06 කින් සමත්වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
I- නවය වසර සමත්වීම.
J- අ. පො. ස. (සා. පෙළ) ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව සම්මාන සහිතව සමත් වී තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ නියැලී සිටීම.
K- අ. පො. ස. (සා. පෙළ) ගණිතය, ඉංග්‍රීසි සම්මාන සහිතව සමත් වී තිබීම හා අ. පො. ස. (උ. පෙළ) ගණිතය විද්‍යා විෂයය ධාරාවකින් හදාරා තිබීම හෝ සැලසුම් ශිල්පී සහතික පත්‍ර පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

සභාපති - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

*ලිපිනය* :
සහකාර අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
අංක 354, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට,
දුරකථන අංකය : 011-3159317, ඊ-මේල් - nvtinarahenpita@vtasl.gov.lk

**ජීවිතයට හැකියාවක් හැකියාවට රැකියාවක්.**

11-760

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.